**රිච්මන්ඩ් විද්‍යාලය - Richmond College**

**දෙවන වාර පරීක්ෂණය 2019**

**2nd Term Test 2019**

| 15 | S | I |
|---|---|---|

**ක්‍රිස්තු ධර්මය I, II** **7 ශ්‍රේණිය :.........**

නම / අංකය:........................................ කාලය -පැය 02 යි.

(සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න)

නම- .......................................................................................පංතිය ........................විභාග අංකය- .................

04

RICHMOND COLLEGE LIBRARY * GALLE *

## 1 කොටස

**(1) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න**

1). "ඔබ සියලුදෙනා මෙයින් පානය කරන්න." ජේසුස්වහන්සේ මේ වදන් පැවසුවේ
1. ගෝලයන්ටය
2. සමූහයාටය
3. පූජකයන්ටය
4. අන්‍ය ජාතීන්ටය

2). කුරුසියේදී ජේසුස්වහන්සේ පැවසූ පළමු වදන
1. "ස්ත්‍රිය මෙන්න ඔබේ පුත්‍රයා මෙන්න ඔබේ මෑණියෝ"
2. "සියල්ල නිමවිය"
3. "පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව"
4. "මට පිපාසා ඇත්තේය"

3). ජේසුස් වහන්සේ උත්ථාන වූ බව පිලිගැනීමට මැලිවූ ගෝලයා
1. යොහාන්ය
2. පේදුරුය
3. තෝමස්ය
4. යාකොබ්ය

4) ජේසුස් වහන්සේ මරණින් උත්ථාන කරනු ලැබුවේ කුමන දිවැසිවරයා පැවසූ අනාගත වාක්‍ය අනුවද?
1. යෙසායා
2. යෙරමියා
3. ජෝවෙල්
4. හොෂියා

5). ප්‍රේරිතයන් ගෙයින් ගෙට යමින් රොටී කැඩීමෙන් පෙන්වූ ලක්ෂණය නම්
1. ප්‍රේමය හා සහෝදරත්වය
2. දේව ගරුබිය
3. එකමුතුකමය
4. චාරිත්‍රය

6). පේදුරුතුමා හා යොහාන්තුමා පළමුවෙන් සුවපත් කලේ
1. අන්ධ මිනිසෙකි
2. යක්ෂාවේෂ වූවෙකි
3. කොරවූ පුද්ගලයෙකි
4. අංගභාග රෝගියෙකි

7). "සමිදුන්ගේ මාවත පිළියෙල කරන්න" පාළුකාරයෙන් මොරගා කියන හඬකි. මේ හඬ
1. ජේසුස්වහන්සේගේය
2. ස්නාවක ජොහාන්තුමාගේය
3. සෙකරියස් පූජකතුමාගේය
4. පරිසිවරුන්ගේය

8) අපගේ සතුරන් සම්බන්ධයෙන් අපට කල නොහැකි අසීරු ක්‍රියාව කුමක්ද?
1. වෛර කිරීම
2. එකට එකකිරීම
3. ප්‍රේම කිරීම
4. පළිගැනීම

9) ජේසුස්වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමේදී ඊට විරුද්ධවූ ශ්‍රාවකයා වූයේ
1. යාකොබ්ය
2. යොහාන්ය
3. පේදුරුය
4. අන්ද්‍රෑය

10) ජුදෙව්වන් පෙන්තකොස්ත මංගල්‍ය පැවැත්වූයේ පාස්කු මංගල්‍යයට දින කීයකට පසුවද?
1. දින 40
2. දින 15
3. දින 50
4. දින 30

11) රෝගී අවස්ථාවකදී සුවය ලබාගැනීම සඳහා වඩා වැදගත් වන්නේ
1. මිල මුදල්ය
2. වෛද්‍යවරුය
3. හිත මිතුරන්ය
4. ශුද්ධාත්ම බලයය

12) යාච්ඤා කිරීමේදී අප අනුගමනය නොකළ යුතු දෙයකි.
   1. අවංකව යාච්ඤා කිරීම
   2. හිස් වචන නොදෙඩීම
   3. ඇතුළු කාමරයට වැද දොර වසා යාච්ඤා කිරීම
   4. වීථිවලට බැස සියල්ලන්ටම පෙනෙන සේ යාච්ඤා කිරීම

13) අපට ලැබී ඇති හැකියාවන් සම්බන්ධයෙන් අප නොකළ යුතු දෙයකි.
   1. ඒවා ක්‍රියාවට නැංවීම
   2. දිනෙන් දින වර්ධනය කර ගැනීම
   3. ඒවා සඟවා තබා ගැනීම
   4. නිසි ලෙස පරිහරණය කිරීම

14) මැවිල්ලේ ප්‍රධාන තැන හිමිවන මනුෂ්‍යයන් වශයෙන් අප ප්‍රථම කොට සෙවිය යුත්තේ
   1. අපේ කෑම බීම ගැනය
   2. ඉදිරි අනාගතය ගැනය
   3. ඇඳුම් පැළඳුම් ගැනය
   4. දේවරාජ්‍යය හා ධර්මිෂ්ඨකම ගැනය

15) චක්‍රකාර දේව නිමැවුමයි
   1. කුරුළු නාදය
   2. තරු පෑයීම
   3. ගොඩනැගිලි තැනීම
   4. හදවතෙහි ක්‍රියාකාරීත්වය

16) බයිබලයට අනුව දේව ගරුබිය පෑම හඳුන්වා දී ඇත්තේ
   1. පරිත්‍යාගය ලෙසය
   2. ප්‍රඥාවේ උල්පත ලෙසය
   3. පාපයෙන් ආරක්ෂාවීම ලෙසය
   4. දේව දරුකම ලෙසය

17) ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයේ දැකගත නොහැකිවූ ගතිගුණයකි
   1. ශ්‍රේෂ්ඨ බව
   2. සරල බව
   3. උඩඟු බව
   4. නිහතමානි බව

18) ජේසුස්වහන්සේ සැම විටම තමන්ට පැමිණි පරීක්ෂාවලින් ජයගත්තේ
   1. දැඩි වදන් පැවසීමෙන්
   2. තර්ක කිරීමෙන්
   3. දෙව් වදන් තුලින්
   4. තරවටු කිරීමෙන්

19) අප වැයවීමෙන් හා කැපවීමෙන් යුතුව සේවය කළ යුත්තේ
   1. ජලය මෙනි
   2. ගින්න මෙනි
   3. ගස්වැල් මෙනි
   4. ලුණු මෙනි

20) ජේසුස්වහන්සේගේ ඉගැන්වීම්
   1. ඉතා සරල විය
   2. සංකීර්ණ විය
   3. තේරුම් ගැනීමට අපහසු විය
   4. මේ සියල්ලම විය

(2x20=40)

## II කොටස

*** පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු ලියන්න.**

**(1) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

1). පහත සදහන් වචන සමාන වන්නේ කුමකටදැයි හඳුන්වන්න
   රොටි -
   මිදි යුෂ -
2) ජේසුස් වහන්සේ සමග ගෙත්සෙමනට ගිය ගෝලයන් නම් කරන්න
3) අපගේ දෙමාපියන්ට අපට කලහැකි උපකාර දෙකක් ලියන්න
4) ගෝලයන් අතරින් "නිවුන්" දරුවා යැයි නම ලැබුවේ කවුද?
5) පෙන්තකොස්ත මංගල්‍ය ගැන කියැවෙන බයිබලයේ පොත කුමක්ද?
6) ජේදුරුතුමා හා ජොහාන්තුමා කළ පළමු සුව කිරීම කුමක්ද?
7) පහත වාක්‍ය යේ හිස්තැන් පුරවන්න.
   ඔබේ ........................................ප්‍රේමකරන්න. ඔබට ........................................කරන්නන් උදෙසා ........................................
8) දේව වචනය අසා පිළිපදින්නන් සමාන වන්නේ කුමකටද?
9) පෙරමග දූත සේවය ඉටු කලේ කවුරුන් විසින්ද?
10) දේව නිර්මාණය අදටත් සිදුවන බවට ඇති සාක්ෂි 2 ක් ලියන්න.

(2x10=20)

**(2) යාච්ඤා කිරීමට ස්වාමීන්වහනසේ අපට මග පෙන්වන සේක**

1) ජේසුස්වහන්සේ ගෝලයන්ට කියාදුන් යාච්ඤාව කුමක්ද? (ල. 2)

2) එම යාච්ඤාවේ අඩංගු ඉල්ලීම් 3 ක් ලියන්න (ල. 3)

3) අප යාච්ඤා කරන අවස්ථා 5 ක් ලියන්න. (ල. 5)

**(3) ශුද්ධාත්මදානය ලැබූ ශ්‍රාවකයෝ**

1) මෙය ශ්‍රාවකයන්ට ලැබුනේ කවදාද? (ල. 2)

2) එදින සිදුවූ විශේෂ සිදුවීම් 3ක් ලියන්න (ල. 3)

3) ශුද්ධාත්මදානය ලැබූ ගෝලයන් තුල දිස්වූ ලක්ෂණ 5 ක් ලියන්න (ල. 5)

**(4) සුවය දෙන සමිඳාණෝ**

1) පේදුරුතුමා හා ජොහාන්තුමා කල පළමු සුව කිරීම කලේ කොහේදීද? (ල. 2)

2) එහිදී පේදුරුතුමා ඔහුට පැවසූ වදන කුමක්ද? (ල. 3)

3) මෙම සුවකිරීමේ සිදුවීම තුල අපට ලද හැකි පාඩම් මොනවාද? (ල. 5)

**(5) කිතුනු අප ඇදහිල්ල තුල ශක්තිමත් විය යුතුය**

1) ක්‍රිස්තියානි ජීවතයේ පදනම කුමක්ද? (ල. 2)

2) ඒ සදහා ජේසුස්වහන්සේ පැවසූ උපමා කථාව කෙටියෙන් ලියන්න. (ල. 3)

3) කිතුනු ඔබ පර්වතය මත ගෙයක් තැනූ තැනැත්තෙකුට සමාන විය යුතුය. මෙය කරුණු 5කින් පැහැදිලි කරන්න. (ල. 5)

**(6) ජේසුස්වහන්සේගේ ඉගැන්වීම්**

1) ජේසුස්වහන්සේ තම ඉගැන්වීම් සදහා යොදාගත් ක්‍රම 2 ක් ලියන්න. (ල. 2)

2) බයිබලයේ එන රන් අණ ලියන්න (ල. 3)

3) රන් අණ අනුව කිතුනු ඔබ සමාජය තුල ක්‍රියා කල යුත්තේ කෙසේද? (ල. 5)